Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

ජනවාරි 03 සතිය

ශ්‍රේණිය - 10 (I වාරය)

සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 6.1.1. එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම් අගයමු**

1. ඉගෙනුම් අත්වැල

- ටවර් නෘත්‍ය ශාලාවේ චිත්‍ර වස්ත්‍ර සකස් කළ රිචඩ් හෙන්රිකස්ගේ බටහිර චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ එම්. සාර්ලිස්ගේ බෞද්ධ චිත්‍ර නිර්මාණ සඳහා ආභාසය විය.
- එම්. සාර්ලිස් ශිල්පියාගේ බෞද්ධ සිතුවම් නිර්මාණ, විහාර සිතුවම් හා ලිතෝ මුද්‍රිත සිතුවම් ලෙස කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.
- ඔහු විසින් ඇඳින ලද බෞද්ධ සිතුවම් 1923 දී ජර්මනියට යවා ලිතෝ මුද්‍රිත ක්‍රමයෙන් පිටපත් ලබා ගැනිණ. එවැනි සිතුවම් 36 කි. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, පියුම් පිට වැඩීම, ශිල්ප දැක්වීම, සිදුහත් යශෝධරා සරණ මංගල්‍යය, සිදුහත් කුමරු හා මව් බිසව, දුෂ්කර ක්‍රියාව, සීවලී මහරහතන් වහන්සේ)
- එම්. සාර්ලිස් ශිල්පියා විසින් සිතුවම් ඇඳ ඇති බෞද්ධ විහාරස්ථාන කිහිපයකි. එනම් කොළඹ මාලිගාකන්ද විහාරය, ඉඳුරුවේ යාලගම විහාරය, මතුගම පාන්තිය ශ්‍රී මංගල විහාරය.
- එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම්වල දැකිය හැකි කලා ලක්ෂණ ලෙස මනා සම්පිණ්ඩනය පර්යාලෝක ලක්ෂණ දැක්වීම එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ දැක්වීම දීප්තිමත් වර්ණ භාවිතය ගත හැකිය.

2. ක්‍රියාකාරකම

1) එම්. සාර්ලිස් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2) එම්. සාර්ලිස්ගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න



- හඳුනාගත් බව : ………………
- ශිල්පියා : ………………
- ශිල්ප ක්‍රමය : ………………
- වර්ණ භාවිතය : ………………
- ශිල්පීය කුසලතා: ………………

3. ඇගයීම

1) එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

3) ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ කලා ආභාසය පිළිබඳ විස්තර කරන්න

4) එම්. සාර්ලිස් ශිල්පියාගේ ප්‍රධාන සිතුවම් 2ක් ගෙන හඳුනාගත් බව, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න